# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College

## පළමු වාර පරීක්ෂණය - 2020
## First Term Test - 2020

| 15 | S | I,II |
|---|---|---|

**ක්‍රිස්තු ධර්මය I, II**
**Christianity I, II**

කාලය පැය තුනයි.

නම / අංකය : ......................................................................

**11 ශ්‍රේණිය**

### I කොටස

* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* **I කොටසේ එක් ප්‍රශ්නයක් සඳහා එක ලකුණක් හිමිවේ.**

(01) "දෙවියන් වහන්සේ අප සමඟය" යන අර්ථය ඇති නාමය වන්නේ,
(i) ක්‍රිස්තොස් (ii) එම්මැනුවෙල් (iii) බිබ්ලිඔන් (iv) ලෝගෝස්

(02) "ගව ඔරුවක බාවා සිටින බිළිඳෙක් ඔබට සම්බවන්නේය. එය ඔබට සලකුණය" මෙසේ පවසන ලද්දේ,
(i) ශාස්ත්‍රවන්තයන්ට (ii) පරිසිවරුන්ට (iii) හෙරෝද් රජුට (iv) එඬේරුන්ට

(03) ඊශ්‍රායෙල් ජනතාවගේ චර්ම ඡේදන පිළිවෙත ආරම්භ වන්නේ කවුරුන්ගෙන්ද?
(i) ආබ්‍රහම්ගෙන් (ii) ජාකොබ්ගෙන් (iii) මෝසෙස්ගෙන් (iv) සාවුල්ගෙන්

(04) පුද්ගලික සිත් හැරීම හා පරාර්ථකාමීව ක්‍රියා කිරීමට යොමු කරවමින් තම දූත මෙහෙවර ඉටුකළේ,
(i) පාවුල්තුමා (ii) ජාකොබ්තුමා
(iii) ස්නාවක ජොහාන්තුමා (iv) ජේදුරුතුමා

(05) "ඔබ පිහානේ ද කෝප්පයේ ද පිටපැත්ත පිරිසිදු කරන්නාහුය." මෙසේ ජේසුස් වහන්සේ චෝදනා කළේ,
(i) නායක පූජකයන්ට (ii) සාමාන්‍ය ජනතාවට (iii) සද්දූසිවරුන්ට (iv) පරිසිවරුන්ට

(06) දාවිත් රජු තමන්ට ද තම පිරිවරටද බඩගිනි වූ විට කළ දේ සිහිපත් කරමින් ජේසුස් වහන්සේ කරුණු පැහැදිළි කළේ,
(i) සබත කඩකිරීමේ ප්‍රශ්නය අවස්ථාවේ (ii) කුරුසිපත් කිරීමට තීන්දු වූ අවස්ථාවේ
(iii) පන්දහසකට කෑම ලබාදුන් අවස්ථාවේ (iv) දාවිත් රජු ගැන කථා කළ අවස්ථාවේදි.

(07) "එතුමන්ගේ පාවහන් පටි මුදන්ටවත් මම නොවටිමි" මෙම ප්‍රකාශයෙන් ඉස්මතු වන්නේ ජොහාන්තුමාගේ,
(i) ශ්‍රේෂ්ඨත්වයයි. (ii) සේවකත්වයයි. (iii) ජේෂ්ඨත්වයයි (iv) නිහතමානීත්වයයි.

(08) ජුදෙව් නමස්කාරයේ කේන්ද්‍රස්ථානය ලෙස සලකනු ලබුවේ,
(i) ධර්මශාලාවයි. (ii) සිනගෝගයයි.
(iii) ජෙරුසලම් දේව මාළිගයයි. (iv) උත්තම පූජකයාගේ නිවසයි.

(09) "මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා !" යන්න ජේසුස් වහන්සේගේ යාච්ඤාව විය. මින් කිතුනු අපට ලබාදෙන ආදර්ශය,
(i) සැමගේ කැමැත්ත ඉටුකළ යුතු බවයි.
(ii) අපගේ කැමැත්තට ක්‍රියාකළයුතු බවයි.
(iii) අන්අයගේ සතුටට ඕනෑම දෙයක්කළයුතු බවයි.
(iv) තමකම සම්පූර්ණයෙන්ම නසා දැමිය යුතු බවයි.

(10) ජේසුස් වහන්සේ කුරුසිපත් කළ මොහොතේ අපහාසාත්මකව හා පරීක්ෂාවට ලක්කරමින් ඔබ ජුදෙව්වන්ගේ රජු නම් ඔබම ගලවා ගන්නයි පැවසුවේ.
(i) මුර සෙබලුන් (ii) කාන්තාවන් (iii) පූජකවරු (iv) සාමාන්‍ය ජනතාව

(11) යහපත් එඬේර ගුණාංග අනුව කිතුනු නායකයන්,
(i) ඔවුන්ගේ අධිකාරීත්වය ප්‍රකාශ කළ යුතුය. (ii) රැලේ ස්වභාවය අධ්‍යනය කළ යුතුය.
(iii) රැල සංඛ්‍යාත්මකව වර්ධනය කළ යුතුය. (iv) කැපවීමෙන් රැල පෝෂණය කළ යුතුය.

(12) සාමය යථාර්තයක් වීම සඳහා,
(i) දේශපාලන ස්ථාවරත්වයක් තිබිය යුතුය. (ii) යුක්තිය හා ධර්මිෂ්ඨකම තිබිය යුතුය.
(iii) ප්‍රචණ්ඩත්වය හෙලා දැකිය යුතුය. (iv) අනුන් විනිශ්චය කිරීමෙන් වැලකිය යුතුය.

(13) දේවගැති සේවය සඳහා වූ කැඳවීමකට ලත් වැදගත්ම ප්‍රතිචාරය වූයේ,
(i) දේවධර්මය හදාරා පැමිණෙමියි යන්නයි.
(ii) සොයුරියන්ගේ අධ්‍යාපනය නිමවූ පසු පැමිණෙමියි යන්නයි.
(iii) උසස් අධ්‍යාපනය මදකට පසෙකලා පැමිණෙමියි යන්නයි.
(iv) මුළු කාලය සේවයට කැප කරමින් පැමිණෙමියි යන්නයි.

(14) දුක් විඳින සේවකයා අනුගමනය කරන කිතුනුවා සේවයේදී,
(i) දුක් විඳීම තුළින් බැහැර විය යුතුය. (ii) දුක් විඳීමේදී ජයග්‍රාහී විය යුතුය.
(iii) දුක් පීඩා තුළ දේව කැමැත්ත සෙවිය යුතුය. (iv) දුකට පත්වූ වන්ට අනුකම්පාව දැක්විය යුතුය.

(15) පීඩනයට පත්වන්නන්ට ඊශ්‍රායෙල් ඉතිහාසයෙන් ලැබෙන මගපෙන්වීම වන්නේ,
(i) නිරතුරුවම දෙවිඳුන් අයැදීමයි. (ii) පීඩනයන්ට විරුද්ධව කෙදිරීමයි.
(iii) පීඩකයන්ට විරුද්ධව නැගීසිටීමයි. (iv) පීඩනය දරාගෙන සිටීමයි.

(16) ශු. ජොහාන්තුමා එල දරන අතු ලෙස සංකේතවත් කළේ,
(i) හොඳින් ගෙඩි හටගන්නා වෘක්ෂයන්ය.
(ii) යහපත් ලෙස දිවි ගෙවන අයයි.
(iii) දිනපතා දේව වචනය කියවන අයයි.
(iv) තම දියුණුව ගැන නිතරම සිතන අයයි.

(17) ජේසුස් වහන්සේ පැවසූ ලෙස වැන්දඹුව විසින් දෙවියන් වහන්සේට පුදනු ලැබුවේ,
(i) තඹ කාසි දෙකකි. (ii) ඇගේ මුළු දේපලේ වටිනාකමය.
(iii) ඇගේ මුළු ජීවිතයයි. (iv) ඇගේ අමතර මුදල්ය.

(18) යුදෙව් කෘෂිකාර්මික මංගල්‍යය නම්,
(i) පෙන්තකොස්ත මංගල්‍යය. (ii) පාස්කු මංගල්‍යය.
(iii) ස්වර්ගාරෝහණ මංගල්‍යය. (iv) කැපකිරීමේ මංගල්‍යය.

(19) දෙවියන් වහන්සේගේ රාජ්‍ය උරුම කරගනු ලබන්නේ,
(i) දැන් සිනාසෙන හා සාගිනිව සිටින අය. (ii) දිළිඳු අය හා දැන් පුෂ්ටිමත්ව සිටින අය.
(iii) ධනවත් අය හා කඳුළු හෙලන අය. (iv) නිහතමානී අය හා දිළිඳු අය.

(20) "ඒකාන්තයෙන්ම දමිදාණන් වහන්සේ නැගිට සිටින සේක." යන්නට සාක්ෂි දැරුවෙකි,
(i) ක්ලෙයොපස් (ii) ජුදස් (iii) සාකේවුස් (iv) ලෙගියොන්

(21) පහත සඳහන් අය අතරින් කමාවීම පිළිබඳ උතුම් ආදර්ශයක් ගෙන දුන්නේ,
(i) ගරු මයිකල් රොඩ්‍රිගෝ පියතුමා (ii) දෙවන ජුවාම් පාවුළු පාප් වහන්සේ
(iii) ගරු තිස්ස බාලසූරිය පියතුමා (iv) තෙරේසා මව්තුමිය.

(22) ජේසුස් වහන්සේ මුහුණ පෑ පළමු පරීක්ෂාව මගින් ගම්‍ය වූ වැදගත් සත්‍යතාවකි.
(i) දේව රාජ්‍යයේ පුරවැසියන් තම ශාරීරික පෝෂණය සලසාගත යුතු බව.
(ii) දේව ගරුබිය පාමින් ප්‍රාතිහාර්ය අත්දැකිය යුතු බව.
(iii) මිනිස් ජීවිතයට ශාරීරික හා ආධ්‍යාත්මික පෝෂණය වැදගත් බව.
(iv) ජීවිත ගැටළු සඳහා විවිධාකාර විසඳුම් සෙවීමට සිදුවන බව.

(23) පව්කාරුවන් සහමුලින්ම ප්‍රතික්ෂේප කළ යුදෙව් ආකල්පය ජේසුස් වහන්සේ අභියෝගයට ලක්කළ අවස්ථාවකි,
(i) කුදු ස්ත්‍රිය සුවපත් කිරීම.
(ii) සීමොන්ගේ නිවසේදී හමුවූ ස්ත්‍රියගේ ක්‍රියාව අගය කිරීම.
(iii) නිකදේමුස් සමග සංවාදයේ යෙදීම.
(iv) අන්ධ බර්තිමියස් සුවපත් කිරීම.

(24) ජේසුස් වහන්සේට සීමොන් පේදුරු හමුවූ මුල්ම අවස්ථාවේදි ඔහුට දුන් අභියෝගය වන්නේ,
(i) මා සමග එක්වන්න යන්නය.
(ii) මාගේ ගොලයකු වන්න යන්නය.
(iii) මාගේ රළ පෝෂණය කරන්න යන්නය.
(iv) මෙතැන්පටන් ඔබ මිනිසුන් දිනනු ඇතැයි යන්නය.

(25) ජේසුස් වහන්සේගේ ඉගැන්වීම අනුව දෙවියන්ගේ කැමැත්ත තේරුම් ගෙන ඉටු කරන්නෝ,
(i) දෙවිවරු මෙන් කරන්නෝ
(ii) දේව පවුලේ සමීප සබඳතාවයට ඇතුළු වෙති.
(iii) දේව අනුගාමිකයින් වෙති.
(iv) දේව දරුවන්වෙති.

(26) රෝම පාලනයට එරෙහිව නැගී සිටි කණ්ඩයම් මර්දනයට සද්දූසිවරු රෝම රජයට සහය දුන්නේ,
(i) රෝම පාලනය ඉතා යහපත් නිසාය.
(ii) ඔවුන් රෝම පාලනයට යටත් වූ නිසාය.
(iii) තම ත්ත්වය හා බලය රැක ගැනීමට.
(iv) රෝම පාලනය දුර්වල වූ නිසා.

(27) ජේසුස් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ක්‍රියා කිරීම නිසා සුවය ලැබූ කාන්තාවන් දෙදෙනා වන්නේ,
(i) මහලේ රෝගී කාන්තාව හා කුදු ස්ත්‍රිය.
(ii) පේදුරුගේ නැන්දනිය හා ජායිරස්ගේ දියණිය.
(iii) ජායිරස්ගේ දිණිය හා මහලේ රෝගී කාන්තාව.
(iv) කුදු ස්ත්‍රිය සහ පේදුරුගේ නැන්දනිය.

(28) "රෝගීන්ට මිස නිරෝගීන්ට වෙදාගෙන් වැඩක් නැත." ජේසුස් වහන්සේ මෙසේ ප්‍රකාශ කළේ,
(i) සීමොන්ගේ නිවසේදී
(ii) ලෙවිගේ නිවසේදී.
(iii) සාකේවුස්ගේ නිවසේදී.
(iv) ජායිරස්ගේ නිවසේදී.

(29) ජේසුස් වහන්සේ මිදිවත්ත හා ගොවීන් ගැන උපමාව වදාළේ සද්දූසිවරුන්ගේ කුමන පැනයට පිළිතුරු ලෙසද?
(i) අධිරාජ්‍යයාට බදු ගෙවීම ගැන පැනයට.
(ii) පුණර්ජීවනය පිළිබඳ පැනයට.
(iii) සබත කඩකිරීම පිළිබඳ පැනයට.
(iv) අධිකාරී බලය පිළිබඳ පැනයට.

(30) ජේසුස් වහන්සේ රාජ තේජසින් ජෙරුසලමට පිවිසීමේදී කොටළුවකු පිට ගමන් කිරීමෙන්,
(i) කොටළුවා අගය කළ සේක.
(ii) දේව රාජ්‍යයේ පදනම සාමය බව පෙන් වූ සේක.
(iii) පරිසිවජරුන්ගේ හැසිරීමට අභියෝග කළ සේක.
(iv) සිය අනුගාමිකයන්ට ආදර්ශයක් දුන් සේක.

(31) ජේසුස් වහන්සේ ජෝර්දාන් ගංහාවෙහි බෞතීස්මයෙන් පසු ශුද්ධාත්මයන් පූර්ණව ගමන් කළේ,

(i) දේවමාළිගයට (ii) පාළුකරයට (iii) සිනයෝගයට (iv) තම නිවසට

(32) වලා පටලය ශුද්ධ බයිබලයේ නිතර සංකේතවත් කරන්නේ,

(i) දේව ස්වරූපය (ii) දේව බලය (iii) දේව අභිමුඛත්වය (iv) දේව මහිමය

(33) රූප විපර්යාසය අවස්ථාවේ ජේසුස් වහන්සේගේ දෙපස දර්ශනය වූ දෙදෙනා සමග සාකච්ඡාවට භාජනයවන්නට ඇත්තේ,

(i) උන්වහන්සේ මහිමයට පත්වන ආකාරය ගැන

(ii) උන්වහන්සේගේ බෞතීස්මය ගැන

(iii) උන්වහන්සේගේ කුරුසි පූජාව ගැන

(iv) උන්වහන්සේගේ බලය ගැන

(34) මුළු ඊශ්‍රායෙල් ජනතාව අතර මෙතරම් ශුද්ධාවක් දැක නැතැයි ජේසුස් වහන්සේ පැවසුයේ,

(i) රෝම ශතාධිපතියා පිළිබඳව .

(ii) කපර් නාවුම්හි රජු පිළිබඳව.

(iii) කුදු ස්ත්‍රිය පිළිබඳව.

(iv) සාකේවුස් පිළිබඳව.

(35) කිතුනු දරුවකු ලෙස වඩාත් සුදුසු ක්‍රියාපටිපාටිය නම්,

(i) වගකීමෙන් ක්‍රියාකළ යුතුය. (ii) වැයවීමෙන් ක්‍රියා කළ යුතුය.

(iii) එකමුතුකමින් ක්‍රියා කළ යුතුය. (iv) දයාවෙන් ක්‍රියාකළ යුතුය.

(36) දේව රාජ්‍යයේ වර්ධනය අත්දකින කිතුනුවා,

(i) යාච්ඤාවෙන් හා ආත්මාර්ථකාමීව ක්‍රියාකරයි. (ii) ඇදහිල්ලෙන් හා ආත්මාර්ථකාමීව ක්‍රියාකරයි.

(iii) බලයෙන් හා පරාර්ථකාමීව ක්‍රියාකරයි. (iv) යාච්ඤාවෙන් හා ඇදහිල්ලෙන් ක්‍රියාකරයි.

(37) ජුදෙව් සමාජය යමෙක් පිළිගැනීමේදී භාවිත කළ සිඹීමේ චාරිත්‍රය ජේසුස් වහන්සේ වෙනුවෙන් භාවිතා කළේ,

(i) සීමොන්ගේ ගෙදරට පිළිගැනීමේදී. (ii) නාසරෙත් ධර්මශාලාවේ දේශනයේ දී.

(iii) ගෙත්සෙමනි උයනේ පාවා දීමේදී. (iv) ජෙරුසලම් දේවමාළිගාවේදීය.

(38) පිටිසර ප්‍රදේශයකින් පැමිණ ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියට සම්බන්ධ වූ පුද්ගලයා වන්නේ,

(i) සිරේනියේ සීමොන් ය. (ii) අරිමාතියේ ජෝසප්ය.

(iii) සිසිලියාවේ ජෝසප්ය. (iv) සිරියාවේ නාමන්ය.

(39) ජුදෙව් ජනතාව අතර බෞතීස්ම පිළිවෙත පැවතුනේ,

(i) ශුද්ධාත්ම අනුහසට විවෘත වීම සඳහාය. (ii) පිරිසිදුවීමේ බාහිර සංකේතයක් ලෙසය.

(iii) පාපය සෝදාහැරීම පිණිසය. (iv) දේව නියෝග පිළිපැදීමක් ලෙසය.

(40) ජේසුස් වහන්සේගේ උත්ථානය හා ස්වර්ගාරෝහණයෙන් පසු ශ්‍රාවකයන්ගේ සාක්ෂි දැරීමේ පදනම වූයේ උන්වහන්සේගේ,

(i) උත්පත්තිය (ii) බෞතීස්මයයි (iii) කැපකිරීමයි (iv) රූප විපර්යාස

(ලකුණු 1 x 40 = 40)

## II කොටස

* පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.

(01) කෙටි පිළිතුරු ලියන්න.

I. දුක් උසුලන සේවකයාගේ ලක්ෂණ දෙකක් ලියන්න.
II. සද්දුසිවරුන් හා පරිසිවරුන්ගේ සේවා මධ්‍යස්ථාන වෙන වෙන ම ලියන්න.
III. පේදුරුගේ මහා ප්‍රකාශය හා ඔහු කළ තවත් ප්‍රකාශයක් ලියන්න.
IV. නාසරෙත්හි සිනගෝගයේ දී ජේසුස් වහන්සේ කළ දේශනයේ සඳහන් කළ ප්‍රස්ථාපිරුළු දෙක ලියන්න.
V. ජේසුස් වහන්සේ මුල් ශ්‍රාවකයන් කැඳවූ ස්ථානය කුමක්ද? එම ස්ථානයට තවත් නමක් ලියන්න.
VI. පිලාත් ඉදිරිපිට ජේසුස් වහන්සේට විරුද්ධව නගන ලද චෝදනා දෙකක් ලියන්න.
VII. දස පනතෙහි ඇති පොරොන්දුවක් සහිත පනත කුමක්ද? එය කී වෙනි පනතද?
VIII. සාමය අර්ථවත් කිරීමට භාවිතා කළ හෙබ්‍රෙව් හා ග්‍රීක වචන ලියන්න.
IX. අවශ්‍යතා ගැන ඇලී ගැලී සිටීමේ නිශ්ඵල බව දැක්වීමට ජේසුස් වහන්සේ දැක්වූ නිදසුන් දෙක මොනවාද?
X. දේව රාජ්‍යයේ පුරවැසියන්ගේ ලක්ෂණ දෙකක් ලියන්න.

(ලකුණු 2 x 10 = 20)

(02)

I. ගොයම නම් බහුලය ගොවීහු විරලය මෙහෙකරුවන් එවන මෙන් කෙතේ ස්වාමියාට යාච්ඤා කරන්න. මෙසේ යවනු ලැබූ සංඛ්‍යාව කීයද? (ලකුණු 02)
II. ඔවුන්ට දුන් අවවාද තුනක් ලියන්න. (ලකුණු 03)
III. එම අවවාද තුළින් අද දේව සේවකයන්ට ලැබෙන ආදර්ශ මොනවාදැයි විස්තර කරන්න. (ලකුණු 05)

(03)

I. ශු. පාවුළුතුමන්ට අනුව ප්‍රේමය නොමැති අය සමාන වන්නේ මොනවාටද? (ලකුණු 02)
II. ප්‍රේමය සම්බන්ධව ජේසුස් වහන්සේ වදාළ ශ්‍රේෂ්ඨතම ආඥාව කුමක්ද? ලියා දක්වන්න. (ලකුණු 03)
III. ප්‍රේම පාරමිතාවේ දැක්වෙන ප්‍රේමයේ ලක්ෂණ පහක් ලියා ඒවා ඔබේ ජීවිතය තුළින් ක්‍රියාත්මක කරන ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

(04)

I. ආබ්‍රහම්ට ලැබුණ දේව කැඳවීම කුමක්ද? (ලකුණු 02)
II. දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමග ඇති කරගත් ගිවිසුමේ ඇතුළත් පොරොන්දු තුන මොනවාද? (ලකුණු 03)
III. එම පොරොන්දු දෙවියන් වහන්සේ ඉටු කළේ ද? ඔබේ පිළිතුර සනාථ කරන්න. (ලකුණු 05)

(05) .

I. ඔබේ පෙළ පොතට අනුව දුක් විඳීමට සිදුවූ පැරණි ගිවිසුමේ පුද්ගලයන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)
II. ඉන් එක් පුද්ගලයෙකුට විඳීමට සිදුවූ පීඩාවන් තුනක් ලියන්න. (ලකුණු 02)
III. කිතුනු දරුවකු ලෙස ඔබගේ ජීවිතයට පැමිණෙන පීඩාවන් තුනක් නම් කර ඒවාට මුහුණ දෙන ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

(06)

I. දේව රාජ්‍යයේ ගුණධර්ම සාමාන්‍ය ජනතාව වෙතට රැගෙන යාමට ජේසුස් වහන්සේ භාවිතා කළ උපක්‍රම දෙකක් ලියන්න. (ලකුණු 03)
II. මිටියාවතේ දේශනයෙන් ජේසුස් වහන්සේ ජනතාවට අවවාද කළ කාරණා තුනක් ලියන්න. (ලකුණු 02)
III. ඉන් එක් කරුණක් කිතුනු ඔබේ ජීවිතයට අදාළ කර ගන්නේ කෙසේදැයි පැහැදිළි කරන්න. (ලකුණු 05)

(07) පහත මාතෘකා අතරින් දෙකක් ගැන කෙටි සටහන් ලියන්න.

I. ලෙවි කැඳවීම.
II. ස්තුතිවන්තභාවය
III. සාමයට කැපවෙමු.
IV. දුක් දරන සේවකයා.

(ලකුණු 2 x 5 = 40)